සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 08 - 2024

## ක්‍රිස්තියානි ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

01. මිනිසා මැවීම පිළිබඳව බයිබලයේ සඳහන් පොත වන්නේ,
1. නික්මයාම ය. 2. මතෙව් ය. 3. උත්පත්ති ය. 4. ගණන් කථාව ය.

02. තහනම් කරනලද ගසේ ගෙඩි වලින් සංකේතවත් කලේ,
1. නපුර ය. 2. දේව කැමැත්ත ය. 3. මරණය ය. 4. පාපය යි.

03. දෙවියන් වහන්සේ විසින් තෝරා ගනු ලැබූ ජනතාව ලෙස හැඳින්වූයේ,
1. මිසර වාසීන් ය. 2. අසිරියානු ජාතීන් ය. 3. පලස්තීන ජාතීන් ය. 4. ඉශ්‍රායෙල් ජාතීන් ය.

04. ශුද්ධ වූ බයිබලයේ සඳහන් ගීතාවලිය පොතේ කතුවරයා වන්නේ,
1. සාවුල් ය. 2. දාවිත් ය. 3. සලමොන් ය. 4. ජොහන් ය.

05. තම ඉගැන්වීම් මගින් මෙන්ම ජීවිතාදර්ශයෙන් යහපත් එඬේරකු ලෙස කටයුතු කලේ,
1. ජේසුස් වහන්සේ ය. 2. ස්නාවක ජොහාන් ය. 3. පේදුරු ය. 4. දාවිත් ය.

06. ''මා අනුව එන්න'' කියමින් ජේසුස් වහන්සේ ගෝලකමට කැඳවන ලද්දේ,
1. පේදුරු ය. 2. ජොහන් ය. 3. මතෙව් ය. 4. තෝමස් ය.

07. ජේසුස් වහන්සේ නාසරෙත්හි ධර්මශාලාවේ දී කියවනු ලැබූ ග්‍රන්ථය වන්නේ,
1. යෙසායා ය. 2. ලූක් ය. 3. I කොරින්ති ය. 4. රෝම ය.

08. ජේසුස් වහන්සේ විසින් විශේෂයෙන් තෝරාගත් ශ්‍රාවකයන් දොළොස් දෙනා හැඳින්වූයේ,
1. දිවසිවරු ලෙස ය. 2. කතුවරු ලෙස ය. 3. දේශකයන් ලෙස ය. 4. ප්‍රේරිතයන් ලෙස ය.

09. ජේසුස් වහන්සේ පාමුල සිටිමින් උන්වහන්සේගේ වචනය ඇසීමට ප්‍රිය කලේ,
1. එලිසබෙත් ය. 2. මාර්තා ය. 3. මරියා ය. 4. ජොවන්නා ය.

10. ''ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝ'' ලෙස හැඳින්වූ ගෝලයා වන්නේ,
1. යොහන් ය. 2. සීමොන් පේදුරු ය. 3. යාකොබ් ය. 4. මතෙව් ය.

11. ශුද්ධාත්ම දීමනා ගැන බයිබලයේ සඳහන් පොත වන්නේ,
1. රෝම ය. 2. ගලාති ය. 3. I කොරින්ති ය. 4. II කොරින්ති ය.

12. ශුද්ධාත්ම ඵල පමණක් අඩංගු පිළිතුර වනුයේ,
1. සාමය, ඉවසීම 2. ප්‍රේමය, නිහතමානීකම 3. කරුණාව, වෛරය 4. අන්‍යභාෂා කථනය, ප්‍රීතිය

13. ඉවිලින් කානි උපත ලැබූ රට වන්නේ,
1. රෝමය ය. 2. කැනඩාව ය. 3. ලංකාව ය. 4. එංගලන්තය ය.

14. ලංකා සභාවේ කුරුණෑගල දියෝනිසියේ තුන්වන බිෂොප්තුමා වන්නේ,
1. ගෞරවනීය සෝමසිරි කුමාරදාස් දේවගැතිතුමා ය. 2. ගෞරවනීය ඩොනල්ඩ් කනගරත්නම් දේවගැතිතුමා ය.
3. ඇන්ඩෲකුමාරගේ දේවගැතිතුමා ය. 4. ගෞරවනීය කුමාර ඉලංගසිංහ දේවගැතිතුමා ය.

15. ජේසුස් වහන්සේ විසින් ආබ්‍රහම්ගේ පුත්‍රයෙකු ලෙස හැඳින්වූයේ,
    1. සාකෙවුස් ය.    2. මතෙව් ය.    3. ලාසරන් ය.    4. යොහන් ය.

16. කිතුනු අපගේ සහන දායකයාණෝ ලෙස හඳුන්වන්නේ,
    1. දෙවියන් වහන්සේ ය.    2. ජේසුස් වහන්සේ ය.
    3. ශුද්ධාත්මයාණෝ ය.    4. රදගුරුතුමා ය.

17. දෙවියන් වහන්සේ වෙතින් මනුෂ්‍යයා ලබා ඇති වටිනාම දීමනාව වන්නේ,
    1. මිනිස් සිරුරයි.    2. නිදහස් කැමැත්තයි.    3. නිරෝගීකමයි.    4. විශ්වාසයයි.

18. දාවිත් රජු රජවීමට පෙර ක්‍රියා කලේ,
    1. ධීවරයෙකු ලෙස ය.    2. අයකැමියෙකු ලෙස ය.    3. දිවැසිවරයෙකු ලෙස ය.    4. එඬේරෙකු ලෙස ය.

19. දෙවියන් වහන්සේ මිනිසා නිර්මාණය කිරීම සඳහා භාවිතා කලේ,
    1. දූවිල්ල ය.    2. ගස්වල අතු ය.    3. පාෂාණ ය.    4. ජලයය.

20. කිතුනු දරුවන් ලෙස අපට වැරදි කරන අයට අප,
    1. වෛර කළ යුතු ය.    2. රණ්ඩුවට යා යුතු ය.    3. සමාව දිය යුතු ය.    4. ප්‍රතික්ෂේප කළ යුතු ය.

(ලකුණු 2×20= 40)

---

## II කොටස

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. **කෙටි පිළිතුරු සපයන්න.**

I. ඉශ්‍රායෙල් ජනතාව වහලුන් ලෙස සිටි වසර ගණන හා සිටි ස්ථානය ලියන්න.
II. ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් අතර සිටි සෙබදීගේ පුතුන් දෙදෙනාගේ නම් සඳහන් කරන්න.
III. ජුදා සමාජයෙන් කොන් කරනු ලැබූ ජන කණ්ඩායම් දෙකක් ලියන්න.
IV. ජේසුස් වහන්සේගේ ප්‍රථම ශ්‍රාවකයින් දෙදෙනෙකු ලියන්න.
V. ගෝලයන් ධර්මදූත සේවයට පිටත්ව යාමට පෙර ජේසුස් වහන්සේ දුන් උපදෙස් දෙකක් ලියන්න.
VI. ශුද්ධාත්ම ඵල දෙකක් ලියන්න.
VII. ජේසුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන කළ දෙදෙනකු ලියන්න.
VIII. දේව සබඳතාවය වර්ධනය කර ගැනීමට කිතුනු දරුවකු වන ඔබ කලයුතු දේවල් දෙකක් ලියන්න.

(ලකුණු 2×8= 16)

02. I. දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනයාට දවල් කාලයට හා රාත්‍රියට රැකවරණය ලබාදුන් ආකාර 2 ක් ලියන්න. (ල. 02)
II. ඉශ්‍රායෙල් ජනතාවගේ වර්ධනය මර්ධනය කිරීමට රජතුමා ගත් තීරණ 3ක් ලියන්න. (ල. 03)
III. කිතුනු දරුවෙකු වන ඔබ පාපයෙන් ඈත්වීමට කරන ක්‍රියා තුනක් ලියන්න. (ල. 06)

03. I. ජේසුස් වහන්සේ මුල්ගෝලයන් කැඳවූයේ කොහේදීදැයි ලියන්න. (ල. 02)
II. ජේසුස් වහන්සේගේ ගෝලයන් තුන්දෙනෙකුගේ නම් සඳහන් කරන්න. (ල. 03)
III. කිතුනු දරුවකු වන ඔබට දේව කැඳවීමක් ලැබුණහොත් ඔබ ක්‍රියාකරන ආකාර 06 ක් ලියන්න. (ල. 06)

04. I. ශුද්ධාත්ම ඵල පිළිබඳව සඳහන් වන්නේ කුමන පොතේදැයි ලියන්න. (ල. 02)
II. ශුද්ධාත්ම ඵල තුනක් ලියන්න. (ල. 03)
III. ශුද්ධාත්ම ඵල අප ජීවිත තුළ වර්ධනය කරගත හැකි ආකාර 6 ක් ලියන්න. (ල. 06)

05. I. ''ගැලවීම අද මේ ගෙදරට පැමිණ ඇත.'' මෙය පැවසූවේ කවුද? කාටදැයි ලියන්න. (ල. 02)
II. කිතුනු අපට පීඩා පැමිණෙන ආකාර තුනක් ලියන්න. (ල. 03)
III. ජේසුස් වහන්සේ හමුවීම තුලින් සාකේවුස්ගේ ජීවිතය වෙනස්වූ ආකාරය ජේළි හයකින් විස්තර කරන්න. (ල. 06)

06. I. නායින් නුවර වැද්දඹුවට ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ කුමක්දැයි ලියන්න. (ල. 02)
II. මරණින් නැගිටවනු ලැබූ පුත්‍රයා නැවත තම මෑණියන්ට භාරදීම තුළින් ලැබෙන පණිවිඩ තුනක් ලියන්න. (ල. 03)
III. දුකට, වේදනාවට පත්වූ ඔබේ යහළුවකු වෙනුවෙන් ඔබට කළහැකි දේවල් 3ක් ලියා විස්තර කරන්න. (ල. 06)